**සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2020**

------------------------------------------------------------

සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 3727 SRI (COL) දරන ණය ගිවිසුම සහ 2018 ඔක්තෝබර් 26 දිනැතිව ඇති කර ගත් අංක 0618 - SRI (SF) දරන දීමනා ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට සහ දීමනා ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය විධායක නියෝජිතායතනය වන අතර මධ්‍යම, උතුරු මැද, සබරගමුව සහ ඌව යන පළාත් සභා සතර මෙම ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ගුණාත්මක අත්‍යවශ්‍ය සෞඛ්‍ය සේවා සඳහා විශ්වීය ප්‍රවේශය සහ අඛණ්ඩ සත්කාර සැපයීමේ සංකල්පය මත පදනම්ව ප්‍රාථමික සෞඛ්‍ය සේවා පද්ධතියේ කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ප්‍රතිචාර දැක්වීම මෙම ව්‍යාපෘතිය මගින් වැඩිදියුණු කරනු ඇත.

ණය සහ ප්‍රදාන ගිවිසුම්වලට අනුව, අනුපිළිවෙළින් සහනදායී ණය වශයෙන් රු. මිලියන 5,813 ට සමාන එජඩො මිලියන 37.5 ක් සහ රු. මිලියන 1,938 ට සමාන එජඩො මිලියන මිලියන 12.5 ක ප්‍රදානයකින් සමන්විත වන එකතුව රු. මිලියන 7,751 කට සමාන එජඩො මිලියන 50 ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇත. ව්‍යාපෘතියේ කටයුතු 2018 දෙසැම්බර් 01 වන දින ආරම්භ කරන ලද අතර 2023 නොවැම්බර් 30 දින වන විට එම ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට නියමිතව තිබුණි.

**1.3 මතය**

------

2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

---------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව අධීක්ෂණය කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. භෞතික කාර්යසාධනය**

**2.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| සංරචකය | ක්‍රියාකාරකම | 2020 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික කාර්ය සාධනය ප්‍රතිශතය | සාක්ෂාත් කර ගන්නා ලද කාර්ය සාධනය ප්‍රතිශතය | ප්‍රමාදය/විගණන නිරීක්ෂණය | ප්‍රමාදයන් සඳහා හේතු |
|---|---|---|---|---|---|
| W-3, 4, 5, 8 සහ 9 | ප්‍රාදේශීය රෝහල් පහේ සහ ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක හයේ ගොඩනැගිලි ඉදිකිරීම් | 100 | 0 | අපේක්ෂිත කාලය තුළ ඉදිකිරීම් අවසන් නොකිරීමේ ගැටළු. | (i) ඉදිකිරීම් ඇඳීම්වල අඩුපාඩු, ප්‍රමාණ බිල්පත් සහ ව්‍යාපෘතිය පිළියෙළ කිරීමේ දී ස්ථානයේ තත්ත්වය සම්බන්ධයෙන් මුහුණ පෑමට සිදු වූ ගැටළු.<br>(ii) වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රමාණවත් ඉදිකිරීම් ද්‍රව්‍ය සහ ශ්‍රමිකයන් නොමැති වීම.<br>(iii) මෙම මධ්‍යස්ථානවල දී කොවිඩ් ආසාදිත රෝගීන්ට ප්‍රතිකාර කිරීම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට වැඩ නතර කිරීමට සිදු විය.<br>(iv) මෙම ඉදිකිරීම්වලින් වැඩි ප්‍රමාණයක් ක්‍රියාකාරී තත්ත්වයේ පවතින රෝහල්වල සිදුවන බැවින්; රෝහල් ක්‍රියාකාරිත්වයට අවම බාධා සිදු වන පරිදි කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ වැඩ සැලසුම් කිරීමට සිදු වීම. |

**කළමනාකාරීත්වයේ ප්‍රතිචාරය** ඉහත සඳහන් කර ඇති කරුණු හේතුවෙන් මෙම ප්‍රමාදයන් සිදුවී ඇති බව.

**විගණකගේ නිර්දේශ** අපේක්ෂිත ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.

**2.2 කොන්ත්‍රාත් පරිපාලනය**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෝරාගත් ඉඩමේ නොගැළපීම් හේතුවෙන් දොළොස්බාගේ ප්‍රාදේශීය රෝහල් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නතර කර තිබුණද, කොන්ත්‍රාත්කරුට ගෙවන ලද වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල වන රු. මිලියන 5.71 ක් ආපසු අය කර ගෙන නොතිබුණි. | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් උප ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කිරීම හේතුවෙන් දොළොස්බාගේ ප්‍රාදේශීය රෝහල ඉදිකිරීම සම්බන්ධයෙන් ගෙවන ලද අත්තිකාරම් මුදල ආපසු අය කර ගෙන නොතිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් සලකා බලමින් පවතී.<br>මේ අතර, යෝජිත ඉදිකිරීම සඳහා හඳුනාගෙන ඇති භූමි ප්‍රදේශයේ දුෂ්කරතා සම්බන්ධයෙන් මූලික කටයුතු කිහිපයක් සිදු කිරීමට කොන්ත්‍රාත්කරුට සිදු වන අතර ඒ සම්බන්ධයෙන් පිරිවැය සමාලෝචනය කරමින් පවතී. | රජයට අලාභයක් සිදු නොවන පරිදි මෙම ගැටළුව කඩිනමින් විසඳීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අඹගස්වැව ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකකය වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව, එහි වැඩකටයුතු 2020 ජූලි 15 වැනිදාට පෙර අවසන් කළ යුතුව තිබුණ ද, 2021 පෙබරවාරි 01 දින වන විට ද එහි කටයුතු අවසන් කර නොතිබුණි. එසේම, උළු සෙවිලි කිරීම සහ සිවිලිම සවි කිරීම සඳහා රු. මිලියන 2.36 ක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම විෂයයන් දෙක අවශ්‍ය ප්‍රමිතියට සිදු කර නොතිබුණි. | කාර්යසාධන බැඳුම්කරය 2021 ජූනි 09 දක්වා අවස්ථා 3 කදී දීර්ඝ කර ඇති අතර දීර්ඝ කරන ලද කාල සීමාව තුළ අත්තිකාරම් සම්පූර්ණයෙන්ම අයකර ගෙන ඇත. | අපේක්ෂිත ගුණාත්මක භාවයෙන් යුක්තව ව්‍යාපෘතිය නියමිත කාලසීමාව තුළ නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | අනුරාධපුර දිස්ත්‍රික්කයේ තිත්තගෝනෑව ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ඒකක ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ව්‍යාපෘතිය 2020 අගෝස්තු මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද, එම ව්‍යාපෘතිය 2021 මැයි 31 වන විට ද අවසන් කර නොතිබූ අතර සේවක රක්ෂණය ද ලබාගෙන නොතිබුණි. | අත්තිකාරම් සහ කාර්යසාධන බැඳුම්කර අනුපිළිවෙලින් 2021 ජූනි 02 සහ 2021 මැයි 28 දක්වා දීර්ඝ කර ඇත. | ව්‍යාපෘතිය නියමිත කාලසීමාව තුළ අවසන් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු අතර අවශ්‍ය රක්ෂණය ද ලබා ගත යුතුය. |
| (ඈ) | හොරොව්පතාන ප්‍රාදේශීය රෝහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය 2020 අගෝස්තු 15 වන විට අවසන් කිරීමට නියමිතව තිබූ නමුත් 2021 මැයි 31 වන විට ද එය අවසන් කර නොතිබුණි. තවද, අංක 33 වැඩ විෂයය නියමිත ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණි. | කාර්යසාධන බැඳුම්කරය 2021 අගෝස්තු 07 දක්වා දීර්ඝ කර ඇත. රක්ෂණ ඔප්පු ලේඛනය ලබාගෙන ඇත. | අපේක්ෂිත ගුණාත්මක භාවයෙන් යුක්තව ව්‍යාපෘතිය නියමිත කාලසීමාව තුළ නිම කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

**2.3 පද්ධති සහ පාලන**

---------------------

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට මුළු ණය මුදල වන එජඩො මිලියන 37.5 කින් එජඩො මිලියන 13.64 ක් පමණක් ගෙවා ඇති අතර එය මුළු ණය මුදලින් සියයට 36.37 ක් පමණක් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය අවසානයේදී භාවිත නොකළ ශේෂය සඳහා බැඳීම් ගාස්තු වශයෙන් රු. 34,435,738 ක් ගෙවීමට සිදු විය. | ආසියානු සංවර්ධන බැංකුව මගින් ණය ගිවිසුමේ එකඟ වී ඇති පරිදි ණය ගිණුමෙන් ඍජුවම හර කරමින් බැඳීම් ගාස්තු අය කර ඇති අතර එයම ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශයේ ණය ගැනුම් පිරිවැය ලෙස හඳුනාගෙන ඇත. | අපේක්ෂිත ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීමට සහ බැඳීම් ගාස්තු අවම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඩබල් කැබ් රථ 07 ක් සහ වෑන් රථ 09 ක් ප්‍රසම්පාදනය සඳහා ලැබී තිබූ ලංසු ඉල්ලා අස්කරගෙන තිබූ බැවින්, රු. මිලියන 2.95 ක් වන ලංසු බැඳුම්කර දෙක මුදල් බවට හරවා ඇත. එහෙත් කිසිදු හේතුවක් හෝ අධිකාරියක් හෝ නොමැතිව රු. මිලියන 1.66 ක් සැපයුම්කරු වෙත ආපසු ලබා දී තිබුණි. | ලංසු වලංගු කාලය තුළ ඩබල් කැබ් රථ 7 ක් සහ වෑන් රථ 9 ක් සඳහා ඉදිරිපත් කළ ලංසු සැපයුම්කරු විසින් ඉල්ලා අස්කර ගෙන ඇත. ඒ මත පදනම්ව, අප විසින් රු. 2,950,000 ක් වූ අදාළ ලංසු බැඳුම්කර වහාම රාජසන්තක කරන ලදී. පසුව ලංසුකරු විසින් වෑන් රථ 9 ක් සඳහා ලංසුවේ වලංගු කාලය දීර්ඝ කිරීමට එකඟ වී ඇත. එ් වන විට, ලංසුකරුවන් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමේ අභිමතය පිළිබඳ ලිපි යවා නොතිබූ අතර මෙම ටෙන්ඩර් තීරණය පිළිබඳව ලංසුකරුවන් කිසිවකු දැන සිටියේ නැත. තවද, අදාළ මාදිලියේ නිෂ්පාදනය අත්හිටුවීම හේතුවෙන් ඩබල් කැබ් රථ 7 ක් සැපයීමට නොහැකි වූ බව ලංසුකරු විසින් සඳහන් කර ඇත. වෑන් රථ 9 ක් සඳහා වූ ලංසුවට අදාළ බැඳුම්කරයේ වටිනාකම අප විසින් ආපසු ගෙවන ලදී. | මේ මුදල වගකිවයුතු පාර්ශ්වවලින් අයකරගත යුතු වේ. |
| (ඇ) | රු. 226,512,562 ක මුළු පිරිවැයකට මිලදී ගෙන සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 84 කදී බෙදා හරින ලද භාණ්ඩ සඳහා භාණ්ඩ නිකුත් කිරීමේ සටහන් නිකුත් කර නොතිබුණි. එසේම, මෙම භාණ්ඩ භාණ්ඩ ලේඛනවල සටහන් කර ඇති බවට සහතික කිරීම සඳහා අදාළ අංශවලින් හෝ ආයතනවලින් භාණ්ඩ ලැබීම් සටහන් රැගෙනවිත් තිබුණේ නැත. | රජයේ මාර්ගෝපදේශවලට අනුකූලව භාණ්ඩ ලේඛන ක්‍රමය විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. | භාණ්ඩ නිකුත් කිරීමේ සටහන් සහ භාණ්ඩ ලැබීම් සටහන් මුදල් රෙගුලාසිවලට අනුව නිකුත් කළ යුතුය. |
| (ඈ) | ව්‍යාපෘති කාර්යාලය සඳහා කුලියට ගත් ගොඩනැගිල්ල සඳහා ඇතුළත් වූ බදු ගිවිසුමේ අත්තිකාරම් ගෙවීමේ කොන්දේසි ඇතුළත් වූ බැවින්, එය නීතිපතිවරයා සමඟ සාකච්ඡා කර සිදු කළ යුතුය. එහෙත් මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ අදහස් විමසා නොතිබුණි. | කාර්යාල පරිශ්‍රය සඳහා ඇතුළත් වූ බදු ගිවිසුම් අලුත් කිරීමේදී මෙම අවශ්‍යතාවයට අනුකූලව කටයුතු සිදු වේ. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | බදු ඉන්වොයිසියක් ඉදිරිපත් නොකළ කොන්ත්‍රාත්කරුවන් 04 දෙනෙකුට අවස්ථා 07 කදී රු. 808,027 ක එකතු කළ අගය මත බද්ද ගෙවා ඇත. තවද, වෛද්‍ය උපකරණ විකිණීමේදී එකතු කළ අගය මත බද්ද අය කර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ සැපයුම්කරුවෙකුට සමාලෝචිත වසර තුළ අවස්ථා දෙකකදී වෛද්‍ය උපකරණ විකිණීම වෙනුවෙන් එකතු කළ අගය මත බද්ද වශයෙන් රු. 1,590,832 ක් ගෙවා ඇත. | එකතු කළ අගය මත බද්දට (වැට්) යටත් වන සැපයුම් ඇති විට, එ් අනුව, ව්‍යාපෘතිය මගින් ප්‍රසම්පාදන අදියරේදී (බදු සමඟ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර) මෙන්ම ගෙවීම් අදියරේදී ද වැට් බදු ලියාපදිංචි කිරීමේ විස්තර පරීක්ෂා කර සත්‍යාපනය කරයි. | පනතට අනුව එකතු කළ අගය මත බද්ද ගෙවිය යුතුය. |
| (ඊ) | ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් සඳහා එකවර අනුමත කළ හැකි උපරිම මූල්‍ය සීමාව රුපියල් 2,000,000 කි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එම සීමාව ඉක්මවා අවස්ථා 12 කදී ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ගෙවීම් අනුමත කර ඇති බව නිරීක්ෂණය විය. | වවුචර අනුමත කිරීමේදී ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ අධිකාරී සීමාව යෙදිය හැකි බවට සාවද්‍ය ලෙස සලකා ඇති බැවින්, මෙම ගෙවීම් ව්‍යාපෘති අධ්‍යක්ෂ මගින් අනුමත කරවා ගැනීමට සිදු විය. | චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුය. |